රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:07/2000

මගේ අංකය:1/543ඊ/16/95
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

2000 මාර්තු මස 02 දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**<u>උසස් කිරීමේදී වැටුප් පරිවර්තනය කිරීම.</u>**

ඉහත කරුණ පිලිබඳව 1994.02.11 දිනැති අංක 11/94 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට ඔබේ අවධානය යොමු කරවමි.

02. එම චක්‍රලේඛයේ උපදෙස් අනුව යම් නිලධාරියෙකුගේ උසස්වීමකට අදාල වැටුප් පරිවර්තනය කිරීමේදී එම නිලධාරියාගේ වැටුප ඔහුට වඩා ජ්‍යෙෂ්ඨත්වයෙන් අඩු නිලධාරියකුගේ වැටුපට වඩා සාපේක්ෂ වශයෙන් අඩු වන අවස්ථා අනාවරණය වී ඇත. එවැනි විෂමතා අවම කිරීම සඳහා අංක 11/94 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

03. ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 5 වන වගන්තිය යටතේ ඇති 5:3, 5:3:1, 5:3:2, 5:3:3, 5:3:4 උප වගන්ති ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්ති ආදේශ කරනු ලැබේ.

**5. <u>උසස් කිරීමේදී වැටුප:</u>**

5:3. නිලධාරියකු උසස්වීම ලැබූ තනතුරේ වැටුප, වැටුප් වර්ධක සහිත වැටුප් ක්‍රමයක් වේ නම්, පහත දක්වා ඇති නියමයන් අනුව ඔහුගේ වැටුප එක් වැටුප් පරිමාණයකින් අනික් වැටුප් පරිමාණයට පරිවර්තනය කළ යුතුය. මෙම වැටුප් පරිවර්තනය සකස් කිරීමේදී වර්ෂයක් තුළ තම උසස්වීම් දිනය දක්වා නිලධාරියකු විසින් උපයා ගන්නා ලද වැටුප් වර්ධකයේ අගයට සමාන මුදල ඔහුට ගෙවිය යුතුය. එසේ ගෙවූ වැටුප් වර්ධකයේ අගයට සමාන මුදල ඔහුගේ උසස්වීමට අදාල වැටුප් පියවර තීරණය කිරීමේදී සැලකිල්ලට නොගෙන පහත සඳහන් පරිදි පරිවර්තනය කළ යුතුය.

5:3:1. උසස්වීම් ලබන අවස්ථාවේදී නිලධාරියා අවසාන වශයෙන් ලැබූ වැටුප නව වැටුප් පරිමාණයේ වැටුප් පියවරවල් අතර ගැනේ නම්, ඔහු ඊළඟ ඉහළ වැටුප් පියවරේ තබනු ලබන අතර, ඔහුට අතිරේක වැටුප් වර්ධකයක් ද ගෙවිය යුතුය.

5:3:2. උසස්වීම් ලබන අවස්ථාවේදී නිලධාරියා අවසාන වශයෙන් ලැබූ වැටුප, නව වැටුප් පරිමාණයේ ආරම්භක වැටුපට හෝ වැටුප් පියවරකට අනුරූප වේ නම් ඔහු ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබිය යුතුය.

5:3:3. උසස්වීම් ලබන අවස්ථාවේදී නිලධාරියා අවසාන වශයෙන් ලැබූ වැටුප, නව වැටුප් පරිමාණයේ ආරම්භක වැටුපට එක් වැටුප් වර්ධකයකින් හෝ ඊට වැඩි වර්ධක ගණනකින් අඩුවන්නේ නම් ඔහු නව වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් පියවරේ තැබිය යුතුය.

5:3:4. උසස්වීම් ලබන අවස්ථාවේදී නිලධාරියා අවසාන වශයෙන් ලැබූ වැටුප, නව වැටුප් පරිමාණයේ ආරම්භක වැටුපට වඩා අඩුවන්නේ එක් වැටුප් වර්ධකයක අගයට අඩු ප්‍රමාණයකින් නම් ඔහු නව වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් පියවරේ තබා අතිරේක වැටුප් වර්ධකයක් ගෙවිය යුතුය.

04. අංක 11/94 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් 5:4, 5:6 හා 5:7 උප වගන්ති නොවෙනස්ව පවතී.

05. අංක 11/94 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් 5:5 උප වගන්තිය අවලංගු කෙරේ.

06. 1988.01.01 දින සිට 1999.12.31 දක්වා ක්‍රියාත්මක වූ අංක 11/94 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන යටතේ උසස්වීම් ලැබූ නිලධාරියකුට කලින් දැරූ තනතුරේ පන්තියේ/ශ්‍රේණියේ වැටුප හා උසස් වූ තනතුරේපන්තියේ/ශ්‍රේණියේ වැටුප් වර්ධක අගය සමානවීමත්, වැටුප් වර්ධක දිනයත්,උසස් වූ දිනයත් එකම දිනක යෙදීමත්,එම පන්තියට/ශ්‍රේණියට තමාට පසු උසස් වූ කණිෂ්ඨ නිලධාරියකුගේ වැටුප් පියවරට වඩා තම වැටුප සාපේක්ෂ වශයෙන් අඩුවී තිබීමත් යන කරුණු තුනම නිසා යම් නිලධාරියෙකුට අවාසියක් සිදු වී තිබේ නම් එවැනි අයෙකුට උසස් වූ තනතුරේ නව වැටුප් පරිමාණයේ තවත් එක් අතිරේක වැටුප් වර්ධකයක් උසස් වූ දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රදානය කළ යුතුය.

07. මෙම චක්‍රලේඛයේ විධිවිධාන 2000.01.01 දින සිට ක්‍රියාත්මක වේ.

08. මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

(මහින්ද බන්දුසේන),
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.